# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

සමාජීයවිද්‍යා පීඨය

ඉතිහාසය - HIST - E 3015

ශ්‍රී ලංකාවේ ඉතිහාසය 1597-1972

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. "ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා පෘතුගීසිහු අවශ්‍ය වෙස්කම් සහිතව දේශීය පාලන ක්‍රමය පවත්වාගෙන යාමට වැඩි කැමැත්තක් දැක්වූහ." 1597 න් පසු මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් අනුගමනය කළ පරිපාලන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මේ ප්‍රකාශය කොතෙක් දුරට නිරවද්‍ය වේද?

02. "භූගෝලීය සාධකවල බලපෑම පෘතුගීසීන් උඩරට රාජ්‍යය අත්පත් කර ගැනීමට ගත් උත්සාහයන් අසාර්ථක වීමට තුඩුදුන් එකම හේතුව නොවේ." සාකච්ඡා කරන්න.

03. ලන්දේසීන්ගේ ආගමික ප්‍රතිපත්ති තුළ අධ්‍යාපනයට හිමි වූ ස්ථානය පරීක්ෂා කරන්න.

04. 1796 සිට 1833 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍ය බලය තහවුරු වීමේ ප්‍රධාන අවස්ථා ගෙන හැර දක්වන්න.

05. 1845 ගිවිසුමේ වගන්ති උල්ලංඝනය කිරීම 1818 කැරැල්ල ඇතිවීමට තුඩුදුන් ආකාරය පරීක්ෂා කරන්න.

06. කෝල්බෲක් කොමිසම විසින් යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම හා පරිපාලන ප්‍රතිසංස්කරණ කවරේද?

07. බ්‍රිතාන්‍ය පාලනයේ අයහපත් බලපෑම් 1848 කැරැල්ල ඇතිවීමට කොතෙක් දුරට හේතුවී ද?

08. "අපනයනය මුල්කොටගත් ආර්ථිකය ප්‍රබල සමාජ පරිවර්තනයක් ඇති කළේය." බ්‍රිතාන්‍ය පාලනය යටතේ වතු ආර්ථිකයෙන් උද්ගතවූ ප්‍රතිඵල ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.

09. විසිවන සියවස මුල දී ශ්‍රී ලංකවේ නැගී ආ අමද්‍යප ව්‍යාපාරයේ ස්වරූපය හා එහි වැදගත්කම සාකච්ඡා කරන්න.

10. ලංකා ජාතික සංගමය පිහිටුවීමට පසුබිම්වූ තත්ත්වයන් පරීක්ෂා කරන්න.

*******************